# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**


අති ගරු ජනාධිපතිතුමා,
ගරු අග්‍රාමාත්‍යතුමා,
ගරු කථානායකතුමා,

2019.07.30

අති ගරු ජනාධිපතිතුමනි/ ගරු අග්‍රාමාත්‍යතුමනි/ ගරු කථානායකතුමනි,

**<u>ඉදිරි ජනාධිපතිවරණය හා පළාත් සභා මැතිවරණය එකම දිනයක පැවැත්වීම.</u>**

අති ගරු ජනාධිපතිතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමනි, ගරු කථානායකතුමනි ඔබ තිදෙනාම දන්නා පරිදි මේ වන විට ඌව පළාත් සභාව හැර සෙසු පළාත් සියල්ලම මහජන නියෝජිතයන්ගෙන් තොරව ආණ්ඩුකාරවරයන් යටතේ පාලනය වේ. ඌව පළාත් සභාවේ නිල කාලයද ඔක්තෝබර් මාසය වන විට අවසන් වීමට නියමිතය. එහෙත් පළාත් සභා නව මැතිවරණ ක්‍රමයට අනුව පවත්වන්නට අවශ්‍ය සීමා නීර්ණය අවසන් කරන්නට තවමත් අප අපොහොසත් වී ඇත. එහෙත් මේ වන විට නැවත වරක් පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා ඇති නීතිමය ඉඩකඩ පරීක්ෂා කිරීමට ජනාධිපතිතුමන්ගේ පාර්ශවයෙන් උත්සහයක් ගන්නා බව වාර්තා වේ.

එමෙන්ම ජනාධිපතිවරණය 2020 දෙසැම්බර් 9 වන දිනට පෙරාතුව පවත්වා ජනාධිපතිවරයෙකු තෝරා ගතයුතුව ඇත.

එබැවින් අප වත්මන් ආණ්ඩුවේ ප්‍රධානීන් ලෙස ඔබ තිදෙනාගෙන්ම ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටින්නේ මෙම මැතිවරණ දෙකම එකම දිනයක පැවැත්වීමට හැකිවන පරිදි පළාත් සභා මැතිවරණ ක්‍රමයට අදාල නීතිය සංශෝධනය කිරීම හෝ වර්තමාන නීතිය බලාත්මකවන දිනය ඉදිරියට ගෙන යාම මගින් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට ඉඩකඩ සලසන ලෙසයි. ඒ හරහා මහජනතාවගේ මුදල් අනිසි ලෙස වැය වීම වලක්වා ගත හැකි අතර මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා සඳහන් කරන ආකාරයට අවම වශයෙන් කෝටි 200 ක මුදලක් ඉතිරි කරගත හැක. එමෙන්ම එක් මැතිවරණයකින් අනතුරුව කඩිනමින් තවත් මැතිවරණයකට යාම ඒ එක් එක් මැතිවරණයේ තිබිය යුතු ස්වාධීන මහජන මතය ප්‍රකාශ කිරීමේ ඉඩ අහිමි වී කෘතිම දේශපාලන රැල්ලක් නිර්මාණය වීමේ හැකියාව ඇති අතර එය ප්‍රජාතන්ත්‍රවාදයට අවැසි යහපත් ලක්ෂණයක් නොවේ. එසේම මාස 6ක් ඇතුලත මැතිවරණ දෙකක් පැවැත්වීමට ක්‍රියාකලහොත් එම මාස 6 කාලය තුලම ආණ්ඩුවේත් විපක්ෂයේත් සියලුම දේශපාලනඥයන් සිය මහජන කාර්යය පසෙක තබා සිය පක්ෂයේ මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කරනු ඇත. එය රටේ සංවර්ධනයටත් ජනතාවගේ එදිනෙදා පැවැත්මටත් අහිතකර ලෙස බලපෑ හැකිය.

එබැවින් අප ඉතා ගෞරවයෙන් ඔබ තිදෙනාගෙන් ඉල්ලා සිටින්නේ මෙම මැතිවරණ දෙක එකවිට පැවැත්වීම සඳහා අවශ්‍ය නීතිමය සංශෝධන පාර්ලිමේන්තුව තුල සකස් කිරීමට අවශ්‍ය නායකත්වය ලබා දෙන ලෙසයි.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

පිටපත - මහින්ද දේශප්‍රිය මැතිතුමා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
උනන්දුවක් දක්වන සෙසු ආයතන


# 12/3, Robert Terrace, Robert Gunawardana Mawatha, Colombo 06, Sri Lanka.
Tel: (+94) 11 2514441 / 11 2514442 Fax: (+94) 11 2514443
E-Mail: paffrel@sltnet.lk Website: www.paffrel.lk


Scanned with CamScanner